# මධ්‍යම පළාත් කෙටි නාට්‍ය උළෙල - 2024

නාට්‍ය කලාවට ඇල්මක් දක්වන මධ්‍යම පළාතේ නාට්‍ය නිර්මාණ ශිල්පීන්ට තම නිර්මාණ එළි දැක්වීමට වේදිකාව සපයීමට, නිර්මාණයන් ඇගයීමට සහ ජාතික තලයට හඳුන්වා දීමට අවස්ථාව සැපයීම අරමුණු කර ගනිමින් මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේ ද කෙටි නාට්‍ය උළෙලක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

**කෙටි නාට්‍ය හැඳින්වීම**

කෙටි නාට්‍යයකට උචිත අනුභූතියක් පිටපත සඳහා තෝරාගත යුතු අතර කෙටි නාට්‍ය අධ්‍යක්ෂණයෙහි මූලිකාංග රැක ගනිමින් කෙටි නාට්‍යයක් නිෂ්පාදනය විය යුතුය. එම නාට්‍ය නිර්මාණය දිගු නාට්‍යයක කාලය කෙටි කර පෙන්වීමක් නොවිය යුතුය. ජවනිකා වෙනස්වීමකින් තොරව උපරිම රංග වින්‍යාසයක් නාට්‍ය අවසානය දක්වා විකාශනය වීම සාමාන්‍ය ඒකාංගික නාට්‍යයක ලක්ෂණය විය යුතු වේ. එසේ වුවද මූලික අර්ථ සීමාවන්ට යටත්ව තාක්ෂණික හා මූලික විධික්‍රම මගින් එකී හැකියාවන් පුළුල් කර ගැනීමෙහිලා බාධාවක් නොකෙරේ.

**තරඟ කොන්දේසි**

1. නාට්‍ය අධ්‍යක්ෂවරයා මධ්‍යම පළාතේ පදිංචිකරුවෙකු විය යුතුය
2. මධ්‍යම පළාත තුළ පිහිටි උසස් අධ්‍යාපන ආයතන, විද්‍යා පීඨ, කාර්මික විද්‍යාල, තාක්ෂණික විද්‍යාල සහ ගුරු අභ්‍යාස විද්‍යාල, තරුණ සේවා සභා ආදී ආයතන වල ඉගෙනුම ලබන දරුවකුනම් මධ්‍යම පළාතේ පදිංචිකරුවකු නොවුවද අයදුම්කල හැකිය
3. මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවන් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංස්කෘතික නිලධාරී විසින් ද සෙසු ආයතනවල අධ්‍යාපනය හදාරන්නන් ආයතන ප්‍රධානියා විසින්ද අනන්‍යතාවය තහවුරු කරන ලද අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.
4. අයදුම්කරු නාට්‍යයේ අධ්‍යක්ෂවරයා විය යුතු අතර ඔහු හෝ ඇය පිටපතෙහි රචකයා නොවන්නේ නම් අදාළ නාට්‍යයෙහි අධ්‍යක්ෂණය සඳහා පිටපත් රචකයාගේ අවසරය ලද ලිපියක් පිටපතට ඇමිණිය යුතුය.
5. නාට්‍යයෙහි රඟ දැක්වෙන කාල සීමාව අවමය විනාඩි 15 කට ද උපරිමය විනාඩි 25 ක්ද විය යුතුය.
6. කෙටි නාට්‍ය තරගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් අයදුම්පත්‍ර සමඟ A4 ප්‍රමාණයේ පරිගණකගත කරන ලද හෝ පැහැදිලි අත් අකුරින් තනි පැත්තේ ලියන ලද නාට්‍ය අත්පිටපත පිටපත් 4 කින් **පළාත් අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය, මහනුවර** යන ලිපිනයට **2024.07.15** වන දිනට පෙර අතින් හෝ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කෙටි නාට්‍ය අත්පිටපත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **මධ්‍යම පළාත් කෙටි නාට්‍ය උළෙල 2024** යන්න සඳහන් කළ යුතුය.
7. අත්පිටපත් භාරගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන නාට්‍ය අත්පිටපත් භාර ගනු නොලැබේ.
8. නාට්‍යයෙහි රඟ දැක්වෙන කාල සීමාව අවමය විනාඩි 15 කට ද උපරිමය විනාඩි 25 ක්ද විය යුතුය.
9. නාට්‍ය අත්පිටපත් යොමු කිරීමේදී නාට්‍ය අත්පිටපත් සමඟ පහත සඳහන් තොරතුරු අමුණා එවිය යුතුය.
    - කතා සාරාංශය
    - නාට්‍ය දෘෂ්ටිය
    - චරිත විග්‍රහය
10. ඉහත තොරතුරු ඇතුළත් කර නොමැති සහ කියවීමට අපහසු අවිධිමත් නාට්‍ය අත්පිටපත් අන්තර්ගතය නොසලකා ප්‍රතික්ෂේප කරනු ඇත.
11. අයදුම්පත්‍රයේ හැර නාට්‍ය අත්පිටපතේ නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ නම සඳහන් නොකළ යුතුය.
12. මෙයට පෙර රාජ්‍ය අනුග්‍රහයෙන් පවත්වනු ලැබූ නාට්‍ය තරගයක ජයග්‍රහණය කර සම්මාන ලැබූ නාට්‍ය ඉදිරිපත් නොකළ යුතුය.
13. රංගන ශිල්පීන්, සංගීතය, වේශ නිරූපන ශිල්පීන් ඇතුළුව සහභාගි වන පිරිස 30 ට කට නොවැඩි විය යුතුය.

14. තමන් කැමති තේමාවක් තෝරා ගත හැකි අතර, එම නාට්‍ය මගින් කිසියම් දේශපාලන පක්ෂයක්, ආගමක්, ජාතියක්, පුද්ගලයෙක් හෝ ආයතනයක් විවේචනය නොවිය යුතුය.
15. ඉදිරිපත් කරන නාට්‍ය තුළ අසැබි දර්ශන හෝ, අසභ්‍ය වදන්, මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ රංගන ඇතුළත් නොවිය යුතුය.
16. එවනු ලබන නාට්‍ය අත්පිටපත් මූලික තේරීමකට ලක් කිරීමෙන් පසු හොඳම අත්පිටපත් තෝරා ගෙන නාට්‍ය නිෂ්පාදනයට අවස්ථාව ලබා දෙනු ලැබේ. ලැබෙන පිටපත් සංඛ්‍යාව අනුව නාට්‍ය නිෂ්පාදනය සඳහා තෝරා ගන්නා අත්පිටපත් සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
17. හොඳම නාට්‍ය අත්පිටපත් අතරට නොතේරුණු නාට්‍ය අත්පිටපත් නාට්‍ය පිටපත යොමුකළ අධ්‍යක්ෂවරයාට අවශ්‍ය නම් පළාත් සංස්කෘතික දෙපාර්මේන්තුවෙන් නැවත ලබා ගැනීමට අවස්ථාව ඇත
18. . විනිශ්චය මණ්ඩලය විසින් තරගය සම්බන්ධයෙන් ලබාදෙන විනිශ්චය පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයා අනුමත කිරීමෙන් පසු එය අවසන් තීරණය ලෙස සැලකේ. එසේම තරගය පැවැත්වීම පිළිබඳ තීරණාත්මක අයිතිය පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයා සතුවේ.
19. නාට්‍ය නිෂ්පාදනය සඳහා තෝරාගත් අත් පිටපත් සංඛ්‍යාව අනුව නාට්‍ය තරග දිස්ත්‍රික් අනුව පවත්වා අවසන් තරගය පවත්වන්නේද එසේ නැතහොත් අවසන් නාට්‍ය තරගයට සියලුම නාට්‍ය සහභාගී කර ගන්නේද යන්න තීරණය කරනු ලබයි. අවසන් වටයේදී ජයග්‍රාහී නිර්මාණ සඳහා චක්‍රලේඛනයේ සඳහන් පරිදි සහතික, ත්‍යාග සහ සම්මාන පිරිනමනු ලැබේ.
20. විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් යම් විශේෂ සම්මාන පිරිනැමීමට හෝ යම් සම්මානයක් පිරිනැමීමට සුදුසු නැතැයි විනිශ්චය මණ්ඩලය නිර්දේශ කරනු ලබන්නේ නම් එකී සම්මානය පිළිබඳව අවසන් තීරණය පළාත් අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබේ.
21. නාට්‍ය තරගයේ නාට්‍ය ප්‍රදර්ශනය කිරීමට දිනය සහ ස්ථානය තීරණය කර ඒ බව නාට්‍ය ඉදිරිපත් කර ඇති අධ්‍යක්ෂවරුන් වෙත දැනුම් දී නාට්‍ය ප්‍රදර්ශනය කිරීමට එකඟව සිටියදී සාධාරණ හේතුවක් නොමැතිව එය ප්‍රදර්ශනය නොකරන්නේ නම් නාට්‍ය නිෂ්පාදක/අධ්‍යක්ෂක තම කැමැත්තෙන් එය ඉවත් කරගත්තා සේ සලකනු ලැබේ. යම් හෙයකින් එකඟ වූ පරිදි නාට්‍ය ප්‍රදර්ශනය කළ නොහැකි නම් ඒ බව ප්‍රදර්ශනයට නියමිත දිනට අවම වශයෙන් දින 7 කටවත් පෙරවත් ලිඛිතව දැනුම් දිය යුතුය.
22. තමන් ඉදිරිපත් කරනු ලබන නාට්‍ය සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරු සපයන්නා වූ හෝ මෙම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්නා වූ හෝ විනිශ්චය මණ්ඩලයේ කටයුතුවලට බාධා කරන්නා වූ හෝ කෙටි නාට්‍ය උළෙලේ කටයුතුවලට බාධා කරන්නා වූ හෝ මෙම නාට්‍ය තරගයට නාට්‍ය ඉදිරිපත් කර ඇති කුමන ආකාරයේ ශිල්පියෙකුට හෝ ශිල්පිනියෙකුට පාඩුවක් හෝ අනර්ථයක් සිදු කරන කවරකුට හෝ මෙම නාට්‍ය උළෙලින් මොන යම් අවස්ථාවකදී වුවද ඉවත් කිරීමට හෝ තිළිණ සම්මාන සහතික ප්‍රදානය සඳහා සලකා බැලීම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයා ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.
23. නාට්‍ය උළෙල සඳහා තෝරා ගත් නාට්‍යයක් සම්බන්ධව කවරකු හෝ අයිතිවාසිකමක් හෝ විරෝධයක් පාන්නේ නම් එකී නාට්‍ය වේදිකා ගත කිරීමට අවම වශයෙන් සති දෙකකට පෙරවත් තම අයිතිවාසිකම් හෝ විරෝධය සංස්කෘතික දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන් පසුව කෙරෙන විරෝධතා සලකා බලනු නොලැබේ.
24. ප්‍රථම දෙවන හෝ තෙවන ස්ථානය ලබා ගන්නා නාට්‍යයන්ගෙන් සුදුසු නාට්‍යයක් කෙටි නාට්‍ය උළෙලේදී එළිදැක්වීමට බලාපොරොත්තු වේ.
25. තෝරාගත් අත්පිටපත් නාට්‍ය නිෂ්පාදනයට ලබාදුන් පසු නාට්‍ය තරගයට පෙරාතුව දිස්ත්‍රික් මට්ටමින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් මූලික නිරීක්ෂණ කටයුතු සිදු කරනු ඇත.
26. කෙටි නාට්‍ය තරගාවලියේ අවසන් තරග ප්‍රතිඵල නාට්‍ය උළෙලට ප්‍රථම ප්‍රකාශයට පත් කරනු නොලැබේ.
27. අධ්‍යක්ෂවරයෙකු හෝ නාට්‍ය සඳහා සහභාගි වන කිසිම ශිල්පියෙකු අනුවර්ත නාම වලින් තරගය සඳහා ඉදිරිපත් නොවිය යුතුය. යම් හෙයකින් එවැනි ගැටළුවක් ඇති වුවහොත් ඒ පිළිබඳ නාට්‍ය අධ්‍යක්ෂවරයා වගවිය යුතු අතර නිකුත් කරනු ලැබූ සම්මානයක්, සහතිකයක් හෝ චෙක්පතක් නැවත දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය නොකරනු ඇත
28. . මෙම ව්‍යවස්ථාව කාලීනව සංශෝධනය කිරීමේ බලය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ.

**සම්මාන ත්‍යාග සහ සහතික පත්‍ර පිරිනැමීම**

| | | |
|---|---|---|
| 1. | පළමු ස්ථානය | රු. 30,000.00 |
| 2. | දෙවන ස්ථානය | රු. 25,000.00 |
| 3. | තෙවන ස්ථානය | රු. 20,000.00 |
| 4. | හොඳම නළුවා | රු. 8,000.00 |
| 5. | හොඳම නිළිය | රු. 8,000.00 |
| 6. | හොඳම සහාය නළුවා | රු.7,000.00 |
| 7. | හොඳම සහාය නිළිය | රු. 7,000.00 |
| 8. | හොඳම අධ්‍යක්ෂණය | රු.7,000.00 |
| 9. | හොඳම රචනය | රු. 7,000.00 |
| 10. | හොඳම රංගාලෝකය | රු. 7,000.00 |
| 11. | හොඳම රංග වස්ත්‍ර නිර්මාණය | රු. 7,000.00 |
| 12. | හොඳම රංග භූමි අලංකරණය | රු. 7,000.00 |
| 13. | හොඳම අංග රචනය | රු. 7,000.00 |
| 14. | හොඳම වේදිකා පරිපාලනය | රු. 7,000.00 |
| 15. | හොඳම සංගීත නිර්මාණය | රු. 7,000.00 |

**කුසලතා ජයග්‍රහණ සඳහා මුදලින් ත්‍යාග සහ සහතික පත්‍ර**

| ඇගයීම | ත්‍යාග මුදල |
|---|---|
| 1. හතරවන ස්ථානය | රු. 15,000.00 |
| 2. පස්වන ස්ථානය | රු. 15,000.00 |
| 3. 06 ස්ථානය - 10 ස්ථානය දක්වා | රු. 10,000.00 (බැගින්) |

**මධ්‍යම පළාත් කෙටි නාට්‍ය තරගය ඉල්ලුම් පත්‍ර පහත සඳහන් ස්ථානවලින් ලබා ගත හැකිය.**

- මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව, යටිනුවර වීදිය, මහනුවර
- මධ්‍යම පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු සංස්කෘතික නිලධාරීන්
- මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. (**www.culture .cp.gov.lk**)

.............................................................

පළාත් අධ්‍යක්ෂ,
මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
යටිනුවර වීදිය,
මහනුවර.

**මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**
**කෙටි නාට්‍ය තරග අයදුම්පත්‍රය -2024**

01.නාට්‍ය රචකයාගේ නම ……………………………………………………………………………………

02.නාට්‍යයේ නම:- …………………………………………………………………………………………..

03. ජාතික හැඳුනුම්පත් අංකය:- ……………………………………………………………………………

04. ලිපිනය:- …………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………..

……………………………………………………………………………………………………………..

05. දුරකථන අංක

ජංගම :- ......................................................................................

ස්ථාවර:- .........................................................................................

06. ඊ-මේල් ලිපිනය:-.............................................................................................................................

07. අධ්‍යක්ෂකගේ නම:-.........................................................................................................................

08. ලිපිනය:- ……………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

……………………………………………………………………………………………………………

09. දුරකථන අංක

ජංගම :- .....................................................................................

ස්ථාවර:- ....................................................................................

10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ..........................................................................................

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරන අතර මා ඉදිරිපත් කරන නාට්‍ය මෙම නාට්‍ය උළෙලට තෝරා ගනු ලැබුවහොත් උළෙලට අවශ්‍ය වන පරිදි ප්‍රදර්ශනය කිරීමටත් පොරොන්දු වෙමි. තවද මා විසින් මෙහි ප්‍රකාශිත තොරතුරු අසත්‍ය යයි ඔප්පු වුවහොත් හෝ ව්‍යවස්ථාවේ සඳහන් කරුණු මා විසින් උල්ලංඝනය කරනු ලැබුවහොත් මධ්‍යම පළාත් කෙටි නාට්‍ය උළෙලේ කුමන අවස්ථාවකදී වුවද මාගේ නිර්මාණය තරගයෙන් ඉවත් කිරීමට හෝ සම්මාන සඳහා නොසලකා හැරීමට මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවට අයිතිය ඇති බව පිළිගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :- ...................................     අත්සන :- ................................

**උසස් අධ්‍යාපන ආයතන, විද්‍යා පීඨ, කාර්මික විද්‍යාල, තාක්ෂණික විද්‍යාල, ගුරු අභයාස විද්‍යාල සහ තරුණ සේවාසභාවේ පුහුණු ආයතන වල අයදුම්කරුවන් සඳහා**

මෙම අයදුම්පත්‍රය සහ නාට්‍ය පිටපත ඉදිරිපත් කරන ................................................................................ මයා / මිය / මෙනවිය / ශිෂ්‍යයා / ශිෂ්‍යයාව මෙම ආයතනයේ ගුරු සේවයේ යෙදෙන /අධ්‍යාපනය ලබන /ක්‍රියාකාරී සාමාජිකයකු / සාමාජිකාවක බව සහතික කරමි.

දිනය :- ...........................................     අත්සන :- ................................................

නිල මුද්‍රාව සහ ආයතන ප්‍රධානියාගේ අත්සන